# සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳුණු අතීත උරුමය (කළුන්දෑව ගම්මානය ඇසුරින්)

එම්. ජී. අකිලා මල්කි නිසංසලා කරුණාරත්න*

පුරාණ ලෝකයේ ගම සංවිධානය වීම ක්‍රි.පූ. 6000 පමණ පැරණි කාලයකදී සිදුවූ බව මානවවංශ විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසුව මිනිසා ශාක හා සත්ව ගෘහස්ථකරණයට යොමුවීමත් සමග ප්‍රාථමික මට්ටමින් නිර්මාණය වූ ගම ක්‍රමයෙන් වර්ධනය වෙමින් වර්තමානය වනවිට ගෝලීය වාණිජකරණයේ බලපෑම හමුවේ අතිශය සංකීර්ණ වී ඇත. දේශීය වශයෙන් ගත්කල කෘෂිකර්මාන්තය පදනම් කරගත් පුරාණ ගමක් සතුව පැවති අතීත ස්පර්ශිත හා නස්පර්ශිත උරුමයන් බොහොමයක් මේ වනවිට අභාවයට ගොස් ඇත. අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ අනුගමනය කරන ලද සාම්ප්‍රදායික ක්‍රමවේද රාශියක් ඇති අතර ඒවා මේ වනවිට ප්‍රායෝගික මට්ටමින් සිදු නොවේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ එම සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳුණු උරුමයන් වර්තමානය තුළ ශේෂ වී ඇත්ද යන්න කළුන්දෑව ගම්මානය ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර ඇසුරින් සිදුකරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණ, අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා, ලිපි ලේඛන හා ග්‍රන්ථ පරිශීලනය මගින් දත්ත එක්රැස් කිරීම සිදුකරන ලදී.

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වූ කළුන්දෑව ගම්මානයේ මඩ ගොවිතැන හා ගොඩ ගොවිතැන යන ද්විත්වයම සිදුවී ඇති අතර ගොඩ ගොවිතැනේදී සැතපුම් 10 -12 පමණ ඔබ්බෙන් වනය තුළට වැදී කැළෑ ගිනි තබා බිම් සකස් කොට තල, කුරහන් වැනි බෝග වගා කිරීම සිදුකර ඇති අතර වගාව ආරම්භයට පූර්වයෙන් දෙවියන් වැඳීම වැනි ඇදහිලි විශ්වාස මුල්කරගත් කටයුතු මෙන්ම වගාව අතරතුර පැල් රැකීම, කෙම් ක්‍රම, උගුල් ඇටවීම, ස්වාභාවික පොහොර යෙදීම වැනි කටයුතු ද සිදු කර ඇත. මඩ ගොවිතැනේ දී බිම් සැකසීම, සාම්ප්‍රදායික කෙම් ක්‍රම භාවිතය, අත්තම් ක්‍රමය ආදිය පැවත ඇත. එසේම සෑම නිවසක්ම අම්බරුවන්, වී බිස්ස හා අටුව යන කෘෂිකාර්මික අංගයන්ගෙන් සමන්විත වී ඇත. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අහිමි වීම, හේන් වගාවට අවැසි ඉඩකඩ නොමැති වීම, කැළෑ කැපීම හා ගිනි තැබීම තහනම් වීම, වන රක්ෂිත නියම කිරීම, ජනගහන වර්ධනය, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය බිහිවීම හා ආර්ථික තරගකාරීත්වය ආදී කරුණු කාරණා හේතුවෙන් හේන් වගාව මේ වනවිට කළුන්දෑව ගම්මානය තුළ දැකගත නොහැකි වේ. එසේ වුවද අධ්‍යයනයෙන් පෙනී යනුයේ තවමත් මඩ ගොවිතැන බොහෝදුරට සාම්ප්‍රදායික ක්‍රමවේද අනුගමනය කරමින් සිදුකෙරෙන බවයි. ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ ශීඝ්‍ර වාණිජකරණය හමුවේ වුවද කළුන්දෑව ගම්මානය තුළ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය හා බැඳුණු අතීත උරුමයන් ජීවමාන අයුරින් ශේෂ වී පවතින බවයි.

ප්‍රමුඛ පදඃ ජීවන රටාව, වානිජකරණය, සාම්ප්‍රදායික ගොවිතැන, මඩ ගොවිතැන, ගොඩ ගොවිතැන

* පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය akila.karunarathna94@gmail.com